සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2024 ජනවාරි

## (301) මූල්‍ය වාර්තාකරණය

(Financial Reporting)

2024-02-10
පෙරවරු
[08.45 – 12.00]

පිටු ගණන : 11
ප්‍රශ්න ගණන : 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

(a) පොදු අරමුණු සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල අරමුණ වන්නේ අස්තිත්වයට සම්පත් සැපයීම සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී එහි ඇල්මැති පාර්ශවයන්ට ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරු සැපයීම වේ. මූල්‍ය තොරතුරුවල ප්‍රයෝජනවත්භාවය වැඩිකරන ගුණාත්මක ලක්ෂණ පවතී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

මූල්‍ය තොරතුරුවල ප්‍රයෝජනවත්භාවය වැඩිකරන ගුණාත්මක ලක්ෂණ දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) අස්තිත්වයක් විසින් යෝග්‍ය ප්‍රාග්ධන සංකල්පය තෝරාගැනීම, එහි මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ගේ අවශ්‍යතා මත පදනම් විය යුතුය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ප්‍රාග්ධනය නඩත්තු කිරීම පිළිබඳ මූලික සංකල්ප දෙක(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

විශේෂිත ව්‍යාපාර අස්තිත්වවල (Specified Business Entities) ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව පිහිටුවා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය සතු බලතල දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ කාර්යයන් තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## **03** වන ප්‍රශ්නය

වර්තමාන ව්‍යාපාර ලෝකය තුළ, ඇල්මැති පාර්ශවයන් විසින් තීරණ ඇගයීමේදී, මූල්‍ය තොරතුරු මෙන්ම මූල්‍ය නොවන තොරතුරු ද ඉතා වැදගත් වේ. අවදානම් හා අවස්ථා සහ උපායමාර්ග හා සම්පත් වෙන්කිරීම, ව්‍යාපාරයක අඛණ්ඩ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය ප්‍රධාන මූලිකාංග දෙකක් වන අතර, සංකලිත වාර්තාකරණයේදී මේ සම්බන්ධව හෙළිදරව් කිරීම අත්‍යවශ්‍ය වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ලැයිස්තුගත සමාගමක වාර්ෂික වාර්තාව තුළ ඇතුළත් වන මූල්‍ය නොවන වාර්තා දෙකක් (02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(b) සංකලිත (integrated) වාර්තාවක් තුළ උපායමාර්ග හා සම්පත් වෙන්කිරීම යටතේ ඇතුළත් වන ප්‍රධාන ක්ෂේත්‍ර (key areas) තුනක් (03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## **04** වන ප්‍රශ්නය

(a) නියමිත නිර්ණායකයන් සම්පූර්ණ කරන්නේ නම් පමණක් සංවර්ධනයෙන් පැන නගින අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගත යුතුය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 38 - අස්පෘශ්‍ය වත්කම් අනුව, සංවර්ධන පිරිවැය, අස්පෘශ්‍ය වත්කමක් ලෙස ප්‍රාග්ධනිත කිරීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි දෙකක් (02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී, **සීමාසහිත එන්රිච් සමාගම** විසින් දේශීය වෙළෙඳපොළ සඳහා නව ක්ෂණික පානයක් (instant beverage) සංවර්ධනය කොට ඇති අතර, 2023 අප්‍රේල් මාසයේදී එහි වාණිජ මෙහෙයුම් ආරම්භ කර ඇත. 2022/23 වර්ෂය තුළදී නව නිෂ්පාදිතය සඳහා දරන ලද පිරිවැය පහත පරිදි වේ:

(1) නව නිෂ්පාදිතය සඳහා රු.500,000/- ක වියදමක් දරා වෙළෙඳපොළ පර්යේෂණයක් සිදුකොට ඇත.

(2) වර්ෂය තුළදී නව නිෂ්පාදිතය සඳහා රු.300,000/- ක වියදමක් දරා පේටන්ට් බලපත්‍රයක් (patent right) ලබාගෙන ඇත.

(3) නව නිෂ්පාදිතයට අදාලව රූපවාහිනී වෙළෙඳ දැන්වීම් සඳහා රු.300,000/- ක පිරිවැයක් දරා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 38 - අස්පෘශ්‍ය වත්කම් අනුව ඉහත සඳහන් එක් එක් පිරිවැය, අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගත හැකිද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 30)

### 05 වන ප්‍රශ්නය

**සීමාසහිත Vinco (පෞද්ගලික) සමාගමේ** 2023 මාර්තු 31 දිනට සහ 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ:

**සීමාසහිත Vinco (පෞද්ගලික) සමාගම**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| මාර්තු 31 දිනට | 2023 | 2022 |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 8,500 | 6,500 |
| අඩු කළා: සමුච්චිත ක්ෂය | (1,300) | (1,000) |
| **ධාරණ අගය** | **7,200** | **5,500** |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 1,950 | 2,300 |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | 2,090 | 1,680 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 2,115 | 1,680 |
| | **6,155** | **5,660** |
| **මුළු වත්කම්** | **13,355** | **11,160** |
| **ස්කන්ධය සහ වගකීම්:** | | |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 80,000) | 8,000 | 8,000 |
| රඳවාගත් ඉපැයීම් | 935 | 560 |
| | **8,935** | **8,560** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| දිගුකාලීන ණය | 900 | 780 |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම) | 490 | 420 |
| | **1,390** | **1,200** |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 2,530 | 1,010 |
| කෙටිකාලීන ණය | 180 | 180 |
| ගෙවිය යුතු ආදායම් බදු | 320 | 210 |
| | **3,030** | **1,400** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **13,355** | **11,160** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් බදු වියදම රු.230,000/- කි.

(2) 2022 අප්‍රේල් 01 දින, සමාගම විසින් රු.1,200,000/- ක් පිරිවැය වූ මෝටර් රථයක් රු.600,000/- කට විකුණන ලදී. විකුණන දිනට එහි සමුච්චිත ක්ෂය වීම, රු.500,000/- ක් විය. මෙම ගනුදෙනුවට අමතරව, දේපළ, පිරියත සහ උපකරණ ගිණුමේ පවතින වෙනස මගින් නියෝජනය වන්නේ 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී අත්පත් කරගත් ඉඩම වේ.

(3) වර්ෂයට අදාල ණය පොලිය රු.250,000/- ක් වන අතර, එය වර්ෂය තුළදීම ගෙවා ඇත.

(4) වර්ෂය තුළදී, සමාගම විසින් එහි සාමාන්‍ය කොටස්හිමියන්ට රු.160,000/- ක අවසාන ලාභාංශයක් ගෙවන ලදී.

(5) 2023 මාර්තු 31 දින, ABC බැංකුව විසින් සමාගම වෙත රු.500,000/- ක දිගුකාලීන ණය මුදලක් ලබාදෙන ලදී.

(6) වර්ෂය තුළදී පාරිතෝෂික ගෙවීම් කිසිවක් සිදුකර නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත Vinco (පෞද්ගලික) සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමය යටතේ **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

(a) 2022 අප්‍රේල් 01 දින, **සීමාසහිත සන්ෂයින් සමාගම,** රු. මිලියන 3 ක අත්තිකාරම් මුදලක් ගෙවා රු. මිලියන 8 ක් පිරිවැය වූ මෝටර් රථයක් මිලට ගත් අතර, ඉතිරි මුදල සඳහා එදිනම **ABC බැංකුවෙන්** මූල්‍ය කල්බදු පහසුකමක් ලබාගන්නා ලදී. මූල්‍ය කල්බදු පහසුකම සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු ඔබ වෙත සපයා ඇත:

| | |
|---|---|
| කල්බදු කාලය | වර්ෂ 4 |
| ව්‍යංග පොලී අනුපාතය | වර්ෂයකට 18% |
| වාර්ෂික කල්බදු වාරිකය | රු.1,858,736/- |

කල්බදු වාරිකය, සෑම වර්ෂයක් අවසානයේදී ගෙවනු ලබන අතර, කල්බදු කාලසීමාව අවසානයේදී මෝටර් රථයේ හිමිකම **සීමාසහිත සන්ශයින් සමාගම** වෙත මාරුවේ. සමාගම විසින් පළමුවන කල්බදු වාරිකය 2023 මාර්තු 31 දින ගෙවන ලදී. මෝටර් රථයේ ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 4 ක් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

මෙම කල්බදු පහසුකම සම්බන්ධයෙන්, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සහ 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උද්ධෘතයන් **පිළියෙල කරන්න.** (ලකුණු 06)

(b) **සීමාසහිත Space Air සමාගම,** අළුතෙන් පිහිටුවන ලද ගුවන් සමාගමක් වන අතර, එහි වාණිජ මෙහෙයුම් සඳහා මගී ගුවන් යානයක් මිලටගෙන ඇත. 2022 අප්‍රේල් 01 දින මිලට ගත් ගුවන් යානයේ පිරිවැය රු. මිලියන 1,200 කි. ගුවන් යානාව, එන්ජින් (Engines), ගොඩබෑමේ උපකරණ (Landing Gear) සහ ගුවන් බඳය (Airframe) වශයෙන් ප්‍රධාන කොටස් 03 කින් යුක්ත වේ.

එක් එක් කොටසෙහි පිරිවැය, ප්‍රයෝජනවත් ආයු කාලය අවසානයේ සුන්බුන් අගය සහ ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

| උපාංගය | මුළු පිරිවැයේ % ක් ලෙස | සුන්බුන් අගය (රු.මිලියන) | ප්‍රයෝජනවත් ආයු කාලය (වර්ෂ) |
|---|---|---|---|
| එන්ජින් | 50% | 100 | 10 |
| ගොඩබෑමේ උපකරණ | 20% | 40 | 5 |
| ගුවන් බඳය | 30% | 60 | 20 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගුවන් යානයේ වාර්ෂික ක්ෂය වීම **ගණනය කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **07** වන ප්‍රශ්නය

(a) **සීමාසහිත Sino සමාගම,** ඛණිජ ද්‍රව්‍ය නිස්සාරණ කටයුතුවල නියුතු සමාගමකි. **සීමාසහිත Sino සමාගමේ** ගණකාධිකාරීවරයා විසින් 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී සිදුවූ පහත සඳහන් සිදුවීම් හඳුනාගෙන ඇති අතර, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවල සලකා නොතිබුණි:

(1) 2022 මැයි මාසයේදී, උපකරණයක පැවති දෝෂයක් හේතුකොටගෙන සමාගමේ සේවකයෙකු සේවයේ යෙදෙන අතරතුර තුවාල ලබා ඇත. ඔහු විසින් තමාට සිදුවූ හානිය වෙනුවෙන් රු. මිලියන 5 ක වන්දියක් ඉල්ලා සමාගමට විරුද්ධව නඩු පවරා ඇත. සමාගමේ නීතිඥවරුන්ගේ අදහස වූයේ අදාළ සම්පූර්ණ වන්දි මුදල ගෙවීම සඳහා වගකීමට යටත්වීමට සමාගමට ඉහළ සම්භාවිතාවයක් පවතින බවය. 2023 මැයි 31 දින, අධිකරණය විසින් රු. මිලියන 3 ක වන්දියක් ගෙවන ලෙස අවසාන වශයෙන් නියෝග කරන ලදී.

(2) මේ අතර, **සීමාසහිත Sino සමාගම** විසින් රු. මිලියන 9 ක වන්දියක් ඉල්ලා උපකරණය සැපයූ සැපයුම්කරුට විරුද්ධව නඩු පවරා ඇත. මෙම නඩුව සාර්ථක වීමට සහ රු. මිලියන 9 ක වන්දි වශයෙන් ලැබීම සඳහා සමාගමට ඉහළ සම්භාවිතාවයක් පවතින බවට සමාගමේ නීතිඥවරුන් විශ්වාසය පළ කරනු ලබයි. අධිකරණය විසින් මීට අදාළ අවසාන තීන්දුව 2023 ජූනි 15 දින තෙක් ලබා දී නොතිබුණි.

(3) 2023 මාර්තු මාසය අවසානයේදී **සීමාසහිත Sino සමාගම,** නව ඛණිජ පතලෙහි වැඩ කටයුතු ආරම්භ කරන ලදී. මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට අවසර ලබාගැනීමේ පියවරක් වශයෙන් සමාගම විසින් මෙම කැනීම් භූමියේ සියලු ඉදිකිරීම් සහ භූමිය නැවත පිරවීම සඳහා නීතිමය වශයෙන් බැඳී සිටී. මෙම වගකීම්වල වර්තමාන වටිනාකම රු. මිලියන 100 ක් වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය 2023 ජූනි 15 දින ලබාදී ඇතැයි උපකල්පනය කරමින්;

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් අනුව 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත Sino සමාගමේ** මූල්‍ය ප්‍රකාශන කෙරෙහි ඉහත සඳහන් සිදුවීම්වල බලපෑම **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(b) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 15 (SLFRS -15) ගනුදෙනුකරුවන් සමග වන ගිවිසුම් යටතේ අයභාරය අනුව අයභාරය හඳුනා ගැනීමේදී අනුගමනය කළ යුතු පියවර පහකින් සමන්විත ආකෘතිය **හඳුනා දක්වන්න**.

(ලකුණු 05)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

සීමාසහිත Global පොදු සමාගමේ ගිණුම් පොත්වලින් 2023 මාර්තු 31 දිනට, පහත සඳහන් ශේෂ පිරික්සුම උපුටාගෙන ඇත:

**සීමාසහිත Global පොදු සමාගම**

**2023 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| **දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැයට / ප්‍රත්‍යාගණිත අගයට:** | | |
| ඉඩම - ප්‍රත්‍යාගණිත අගයට (පිරිවැය - රු. මිලියන 35) | 40,000 | |
| ගොඩනැගිල්ල | 55,000 | |
| යන්ත්‍ර | 28,000 | |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | 14,000 | |
| **2022 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| ගොඩනැගිල්ල | | 14,000 |
| යන්ත්‍ර | | 12,000 |
| 2023 මාර්තු 31 දිනට තොගය, පිරිවැයට | 24,000 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 10,250 | 6,500 |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 16,150 | |
| 2022 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා වන ප්‍රතිපාදනය | | 2,900 |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික ප්‍රතිපාදනය) | | 8,500 |
| උපචිත වියදම් | | 8,000 |
| ගෙවූ ආදායම් බදු | 12,400 | |
| විකුණුම් පිරිවැය / විකුණුම් | 116,000 | 206,000 |
| වෙනත් ආදායම් | | 6,400 |
| 2022 මාර්තු 31 දිනට ගෙවිය යුතු ආදායම් බදු | | 8,100 |
| බැංකු ණය | | 9,000 |
| පරිපාලන වියදම් | 40,000 | |
| බෙදාහැරීමේ වියදම් | 37,000 | |
| මූල්‍ය වියදම් | 1,100 | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 10,000,000) | | 95,000 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 5,000 |
| 2022 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 12,500 |
| | **393,900** | **393,900** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) සමාගමේ වර්ෂ අවසාන තොගය තුළ සෙමින් චලනය වන (slow moving), පිරිවැය රු.1,200,000/- ක තොගයක් පවතින බවට වර්ෂ අවසානයේ සිදුකරනු ලබන භෞතික තොග ගණනයේදී හෙළිදරව් විය. මෙම තොගය 2023 අප්‍රේල් 12 දින රු.800,000/- කට ගනුදෙනුකරුවෙකුට විකුණන ලදි.

(2) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබන අතර, එම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

ගොඩනැගිල්ල : වර්ෂ 50

යන්ත්‍ර : වර්ෂ 05

(3) 2023 මාර්තු 31 දින, සමාගම විසින් යන්ත්‍ර සඳහා හානිකරණ පරීක්ෂාවක් සිදුකරන ලද අතර, එහිදී යන්ත්‍රයේ භාවිතයට ගැනීමේ අගය (value in use) සහ යන්ත්‍රයේ ඉවත්කිරීමේ පිරිවැය අඩු කල පසු සාධාරණ වටිනාකම පිළිවෙලින් රු.8,400,000/- ක් සහ රු.9,000,000/- ක් බවට අනාවරණය විය. මෙම හානිකරණය සම්බන්ධයෙන් ගිණුම් පොත්වල කිසිදු ගැලපීමක් සිදුකර නොමැත.

(4) සමාගම විසින් එහි ඉඩම 2020/21 වර්ෂයේදී ප්‍රථමයෙන් ප්‍රත්‍යාගණනය කරන ලද අතර, එය නැවතත් 2023 මාර්තු 31 දින රු.43,000,000/- කට ප්‍රත්‍යාගණනය කරන ලදී. නමුත් මෙය ගිණුම් පොත්වල සටහන් කර නොමැත.

(5) 2022 ජුනි 01 දින, සමාගම විසින් එහි ආහාර සැකසුම් කර්මාන්තශාලාව ඉදිකිරීම සඳහා වාර්ෂිකව 8% ක පොලී අනුපාතිකයක් යටතේ රු.9,000,000/- ක බැංකු ණය මුදලක් ලබාගන්නා ලදී. 2022 ජූලි 01 දින කර්මාන්තශාලාවේ ඉදිකිරීම් ආරම්භ කරනු ලැබූ අතර, 2023 මාර්තු 31 දින වන විටත් එය ඉදිකෙරෙමින් පැවතුණි. වර්ෂය තුළදී, ඉදිකිරීම් සඳහා දරණ ලද පිරිවැය, ප්‍රාග්ධන නොනිමි වැඩ ගිණුමෙහි වාර්තා කර ඇත. වර්ෂය සඳහා වන ණය පොලිය, මූල්‍ය වියදම් යටතේ වාර්තාකර ඇත. ණය මුදලේ ප්‍රාග්ධන ආපසු ගෙවීම සඳහා බැංකුව විසින් වර්ෂ 2 ක සහන කාලයක් ලබාදී ඇත.

(6) සමාගම විසින් 2021 මාර්තු මාසයේදී බෙදාහැරීමේ වියදම්වල බොල් ණය වශයෙන් කපාහරින ලද රු.600,000/- ක මුදලක් වර්ෂය තුළදී ආපසු අයකරගෙන ඇත. ලද මුදල, වෙළෙඳ ලැබිය යුතු මුදල් ගිණුමට බැරකොට ඇත. සමාගමේ තවත් ගනුදෙනුකරුවෙකු බුන්වත්භාවයට පත්වී ඇති අතර, ඔහුගෙන් අයවිය යුතු රු.250,000/- ක මුදල, බොල් ණය ලෙස කපා හැරීමට සමාගම තීරණය කොට ඇත. නමුත්, මෙය ගිණුම් පොත්වල සටහන් කොට නොමැත. තවද, 2023 මාර්තු 31 දිනට පැවති ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 5% ක වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය ලෙස පවත්වාගෙන යාමට කළමනාකාරිත්වය විසින් තීරණය කර ඇත.

(7) 2022/23 වර්ෂය තුළදී ලද රු.1,200,000/- ක ආයෝජන ආදායම, වෙනත් ආදායම් යටතේ ගිණුම්ගතකොට ඇත. 2023 මාර්තු මාසයට අදාල ආයෝජන ආදායම වන රු.400,000/- ක් 2023 අප්‍රේල් මාසය තුළදී ලැබුණු අතර, එය ගිණුම් පොත්වල සටහන්කොට නොමැත.

(8) 2022 මාර්තු 31 දිනට ගෙවිය යුතු ආදායම් බදු වගකීම රු.8,100,000/- ක් ව අතර, 2022/23 තක්සේරු වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු.9,250,000/- ක් ලෙස ඇස්තමේන්තුගතකොට ඇත. 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී කල සියලු ආදායම් බදු ගෙවීම් "ගෙවූ ආදායම් බදු" ගිණුමට අයකර ඇත.

(9) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වන අනුමැතිය 2023 මැයි 31 දින ලබාදෙන ලදී.

**ඔබ විසින් කල යුතු දෑ:**

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත Global පොදු සමාගමේ පහත සඳහන් දෑ, පිළියෙල කරන්න**:

(a) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභා'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 10)

(b) 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 08)

(c) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 03)

(d) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන සටහන. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

**සීමාසහිත ජයලංකා පොදු සමාගමේ** 2023 මාර්තු 31 සහ 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශන උද්ධෘතයන් සහ 2023 මාර්තු 31 සහ 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන උද්ධෘතයන් පහත පරිදි වේ:

**සීමාසහිත ජයලංකා පොදු සමාගම**

**ආදායම් ප්‍රකාශනවල උද්ධෘත** *(රු.'000)*

| **මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **2023** | **2022** |
|---|---|---|
| පිරිවැටුම | 683,700 | 487,900 |
| විකුණුම් පිරිවැය | (321,800) | (286,700) |
| පොලී වියදම | (7,540) | (6,280) |
| වර්ෂය සඳහා ආදායම් බදු | (3,800) | (4,250) |
| බදු පසු ලාභය | 36,450 | 19,820 |

**සීමාසහිත ජයලංකා පොදු සමාගම**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල උද්ධෘත** *(රු.'000)*

| **මාර්තු 31 දිනට** | **2023** | **2022** |
|---|---|---|
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 141,500 | 119,800 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 45,720 | 110,910 |
| තොගය | 81,400 | 79,600 |
| නිකුත්කොට ඇති බරතැබූ සාමාන්‍ය කොටස් ගණන ('000) | 8,500 | 8,500 |

පහත සඳහන් අතිරේක තොරතුරු සළකා බලන්න:

(1) මුළු පිරිවැටුමෙන් 60% ක් ණයට විකුණුම් වේ.

(2) ගැනුම්වලින් 90% ක් ණය පදනම මත වේ.

(3) කොටසක වෙළෙඳපොළ මිල රු.20/- ක් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / අවසන් දිනට පහත සඳහන් අනුපාත **ගණනය කරන්න**:

(i) ශුද්ධ ලාභ අනුපාතය.

(ii) තොග රඳවා ගැනීමේ කාලය.

(iii) ණයගැති එකතුකිරීමේ කාලය.

(iv) ණයහිමි පියවීමේ කාලය.

(v) කොටසක ඉපැයුම.

(vi) මිල ඉපැයුම් අනුපාතය. (ලකුණු 06)

(b) **ජයලංකා පොදු සමාගම** නියුතුව සිටින කර්මාන්තයේ, කර්මාන්ත සාමාන්‍යයන් පහත පරිදි වේ:

| | |
|---|---|
| ශුද්ධ ලාභ අනුපාතය | 10% |
| තොග රඳවාගැනීමේ කාලය | දින 90 |
| ණයගැති එකතුකිරීමේ කාලය | දින 65 |
| ණයහිමි පියවීමේ කාලය | දින 73 |
| කොටසක ඉපැයුම | රු.7.50 |
| මිල ඉපැයුම් අනුපාතය | වාර 2.67 |

**සීමාසහිත ජයලංකා පොදු සමාගමේ** ඉහත ගණනය කරන ලද අනුපාතයන්, කර්මාන්ත සාමාන්‍යයන් සමඟ සසඳමින් විචලනයන්ට හේතුවිය හැකි කරුණු පැහැදිලි කරමින් සාරාංශගත වාර්තාවක් **පිළියෙල කරන්න.**

(ලකුණු 06)

(මුළු ලකුණු 12)

## 10 වන ප්‍රශ්නය

2022 අප්‍රේල් 01 දින, **සීමාසහිත තෝමස් පොදු සමාගම** විසින් **සීමාසහිත ගෝමස් පොදු සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 80% ක් රු. මිලියන 350 ක මුදලකට අත්පත්කර ගන්නා ලදී.

**සීමාසහත තෝමස් පොදු සමාගමේ** සහ **සීමාසහිත ගෝමස් පොදු සමාගමේ** 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත පරිදි වේ:

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| | **සීමාසහිත තෝමස් පොදු සමාගම** | **සීමාසහිත ගෝමස් පොදු සමාගම** |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ, ධාරණ අගයට | 540,000 | 240,000 |
| **සීමාසහිත ගෝමස් පොදු සමාගමේ** ආයෝජනය | 350,000 | - |
| **සීමාසහිත ගෝමස් පොදු සමාගමේ** ණයකරවල ආයෝජනය | 40,000 | - |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 117,000 | 150,000 |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | 180,000 | 90,000 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 18,000 | 90,000 |
| **මුළු වත්කම්** | **1,245,000** | **570,000** |
| **ස්කන්ධය සහ වගකීම්:** | | |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 700,000 | 300,000 |
| රඳවාගත් ඉපැයීම් | 225,000 | 90,000 |
| **ජංගම නොවන වගකීම්:** | | |
| බැංකු ණය | 125,000 | 44,000 |
| ණයකර | - | 100,000 |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් | 135,000 | 25,200 |
| බැංකු අයිරාව | 60,000 | 10,800 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **1,245,000** | **570,000** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) අත්පත් කරගත් දිනට, **සීමාසහිත ගෝමස් පොදු සමාගමේ** ඉඩම හැර ශුද්ධ වත්කම්වල පොත් අගය මගින් ඒවායේ සාධාරණ අගය නිරූපණය වේ. ඉඩමේ සාධාරණ අගය, එහි ධාරණ අගයට වඩා රු.5,000,000/- කින් වැඩිය.

(2) අත්පත් කරගත් දිනට, පාලනය නොවන හිමිකමෙහි සාධාරණ අගය [Non-Controlling Interest (NCI)] රු. මිලියන 100 ක් සහ **සීමාසහිත ගෝමස් පොදු සමාගමේ** රඳවාගත් ඉපැයීම් රු.75,000,000/- ක් විය.

(3) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී, **සීමාසහිත ගෝමස් පොදු සමාගම** විසින් රු.9,000,000/- ක් වටිනා භාණ්ඩ **සීමාසහිත තෝමස් පොදු සමාගමෙන්** මිලට ගන්නා ලදී. 2023 මාර්තු 31 දිනට මෙම භාණ්ඩවලින් තුනෙන් එකක (1/3) කොටසක් නොවිකිණී **සීමාසහිත ගෝමස් පොදු සමාගමේ** ගබඩාව තුළ පැවතුණි. **සීමාසහිත තෝමස් පොදු සමාගමේ** විකුණුම් ප්‍රතිපත්තිය වන්නේ පිරිවැය මත 20% ක ලාභයක් තබා ගැනීම වේ.

(4) **සීමාසහිත තෝමස් පොදු සමාගමේ** ණයකර ආයෝජනය තුළ ඇතුළත් වන්නේ **සීමාසහිත ගෝමස් පොදු සමාගම** විසින් නිකුත් කර ඇති ණයකර වේ.

(5) 2023 මාර්තු 31 දිනට හානිකරන සමාලෝචනයක් සිදුකරනු ලැබූ අතර, **සීමාසහිත ගෝමස් පොදු සමාගම** අත්පත් කරගත් අවස්ථාවේ ඇති වූ කීර්තිනාමය, රු. මිලියන 10 කින් හානිකරණය වී ඇතැයි එහිදී අනාවරණය විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත ගෝමස් පොදු සමාගම,** අත්පත් කර ගැනීම මත ඇති වූ කීර්තිනාමය **ගණනය කරන්න**. (ලකුණු 04)

(b) 2023 මාර්තු 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **පිළියෙල කරන්න.** (ලකුණු 09)

(මුළු ලකුණු 13)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අදින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අන්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන ඇ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |